www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීනය ධනපති ප්‍රභූව වෙනුවෙන් පෞද්ගලික දේපල නීතිය සම්මත කරයි

## China passes private property law for capitalist elite

**ජෝන් චැන් විසිනි**
**2007 මාර්තු 30**

බීජිනයේ දින දොලහක් පැවති ජාතික මහජන කොන්ග්‍රසයේ (එන්පීසී) සැසිය අවසානයේ ,මාර්තු 14 වෙනිදා තෝරා ගනු ලැබූ 3,000ක් පමන වූ නීති සම්පාදකයෝ දේපල පනතට අනුමැතිය දුන්හ. 2002 දී චීන කොමියුනිස්ට් පක්ෂ (චී.කො.ප) සාමාජිකත්වයේ දොරටු පුද්ගලික ව්‍යාපාරිකයන්ට විවෘත කරලීමෙන් අනතුරුව පැමිනි මේ නීති සම්පාදනය චීනය තුල ධනපති දේපල සබඳතාවල ආධිපත්‍යය තහවුරු කරලීමේ කැපී පෙනෙන පියවරකි.

එම නීතියේ මෙසේ සටහන්ව තිබේ.''රාජ්‍යයේ ,සාමුහික, පුද්ගලික හා අනෙකුත් අදාල අය ගේ දේපල නීතියෙන් රැකවරනය ලබන අතර ඒකකයන් හෝ පුද්ගලයකු එය කඩකල යුතු නොවේ''. පෞද්ගලික දේපල රාජ්‍ය දේපල තත්වයට ඔසවා තැබීම තුලින් මෙම නීතිය චීනයේ වැඩෙන පෞද්ගලික ව්‍යාපාරයන්ට රූපික නීතිමය රැකවරනය ලබා දෙන අතර දශක හයකට පසුව ප්‍රථම වතාවට කම්කරු පංතිය ධනපති සූරා කෑමට ලක් කිරීම නීතිගත කරයි.

මත භේදයන් නිසා පනත පසු ගිය වසරේ දී එලිපෙහෙලියට නොගෙන තැබුනකි. සිය ගනනක් විශ්‍රාමික නිලධාරින්ගේ සහ විද්වතුන්ගේ අනුමැතිය ලද පෙත්සමක් මඟින් මෙම නීතිය සමාජ අසමානතාවය ඉහල නංවා නිලධාරීන් විසින් රජය සතු වත්කම් දූෂිත ලෙස කොල්ලකෑම නීත්‍යානුකූල කරනු ඇතැයි අනතුරු ඇඟවීය.''පෞද්ගලීකරනය නොනැවතී පෙරටයාම සමඟ දැනටමත් අප රටේ,අන්ත දෙකක ධ්‍රැවාන්ත ගතවීමක් ඇති කරන ,පොහොසතුන් හා දුප්පතුන් අතර බැරෑරුම් පරතරයක් තිබේ''යයි පෙත්සමේ ප්‍රකාශ වෙයි.

හොංකොංහි පලවන 'ඒෂියා වීක්ලි' පුවත් පතට අනුව ජනාධිපති හු ජින්තාඕ සහ අගමැති වෙනි ජියාන්ඕ විසින් එන්පීසී සැසියට පෙරාතුව නීතිය සඳහා සහයෝගය පතා අඬහැර පානු පිනිස පලාත්බඳ සංචාරයකට නිලධාරීන් පිටත් කර හරිනු ලැබීය. සියයට 10 ක විරුද්ධත්වය පවා දේශපාලනික අපහසුතාවයක් වනු ඇතැයි බිය වූ ඉහල නිලධාරිහූ නියෝජිතයන් පැමිනි කල ඔවුන්ට එකඟතාවය වෙනුවෙන් ඡන්දය දමන ලෙස උපදෙස් දුන්හ.14 වසරක් තිස්සේ විවාදයට ලක්වෙමින් තිබූ පනත හුදු මිනිත්තු තුනක කාලයක් තුල, පක්ෂව 2,799ක්, වැලැකී සිටී 37ක් සහ විරුද්ධව 52ක් ලෙස සම්මත විය.

නීතිය සම්බන්ධව ඡන්දය අද චීනයේ හොඳින් පෙනෙන කාරනා දෙකක් ඉස්මතු කරලයිඃ ඒ,තමන් ''සමාජවාදී''බවට චීකොප ය කරන වංචනික මවා පෑම සහ නව දේපල හිමි ප්‍රභූව අත වැඩෙන වත්කම් සංකේන්ද්‍රනය ය.

චීනයේ නිල වෙබ් අඩවිය මාර්තු 16 වනදා චීනය විසින් ලොව සිව්වන විශාල ආර්ථිකය ලෙස කැනඩාව , ඉතාලිය, ප්‍රංශය සහ බ්‍රිතාන්‍ය පසු කර යාමට හේතුව වනුයේ 'සමාජවාදය' බවට විකාර සහගත ප්‍රකාශයක් කලේය. මෙම ඉහල යාම, ''අනාගතය සමාජවාදයයි, සමාජවාදය ධනවාදයට වඩා ශ්‍රේෂ්ඨයි යන්න මනුෂ්‍ය වර්ගයාට පෙන්නුම් කර සිටී''.

සත්‍ය කරුන නම්, චීකොපය විසින් චීනය විදේශ ආයෝජකයන්ට සහ දේශීය ව්‍යවසායකයන්ට අබාධිතව හෝ සුළු සීමා ඇතිව ලාභ ශ්‍රමය සූරා කෑ හැකි දැවැන්ත ශ්‍රම අංගනයක් බවට පරිවර්තනය කර ඇති බවය, ''ෆෝබ්ස්''සඟරාව විසින් රැස් කරන ලද 2006 චීන ඉහලම ප්‍රකෝටිපතියන් 10 දෙනාගේ ලැයිස්තුව චීනයේ ''සමාජවාදයේ'' වාසිය ලබන්නෝ කම්කරුවන් නොව ධනපතියන් බව පෙන්වයි.

අංක 1 වනුයේ තවමත් 37 වියැති 'නෝම් ඇප්ලියාන්ස් 'නම් රටේ විශාලතම ගෘහස්ත උපකරන අලෙවි ආයතනයේ හිමිකරුවා වන රවාං ක්වොං යූ වන අතර ඔහුගේ පෞද්ගලික ධනස්කන්ධය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.1ක ධනය ඇති නිකේතන හා හෝටල වත්කම් කුවේර ෂෝ රොග්මාඕය. අංක3, 1948 විප්ලවයෙන් අනතුරුව මාඕ සේංඩාංට සහාය පලකල සුප්‍රකට 'රතු ධනපතියා' වන රොංයිරෙන් අංක4, රට පුරා පැතිරුන දේපල වෙලඳ සමාගම වන හොප්සන් හිමිකාර ,පෙර දී රාජ්‍ය නිලධරයකු වූ ෂූ මෙංයීය .ඔහු ගේ වත්කම ඩොලර් බිලියන 1.9 කි . අංක 5 ලොව විශාලතම කඩදාසි

බෝඩ් නිශ්පාදන සමාගම් අතුරින් එකක් වන 'නයින් ඩ්‍රගන්ස් ' හිමිකාරිය වන යෑං ෂුං ය. ඇය ගේ වත්කම ඩොලර් බිලියන 1.5 කි.

තවත් දේපල ව්‍යාපාරිකයකු වන ඩොලර් බිලියන 1.45ක් සතු ෂෑං ලී 6වැනියාය. අංක 7වන ෂී ෂෙංග්‍රෝ ලොව වේගයෙන්ම වර්ධනය වන සූර්ය ශක්ති සංගතයන් ගෙන් එකක් වන හැස්ඩෙක් ලැයිස්තු ගත සන්ටෙක් ව්‍යාපාරයේ හිමිකාරියයි.

ඇය ඉහල යන බටහිර අධ්‍යාපනය ලැබූ ව්‍යවසායක පිරිස අතුරින් එකියකි. ඇලුමිනියම් කර්මාන්තය පදනම් කර ගත් 'ඊස්ට් හෝප් ගෲප් ' හිමිකාර ලින් යොෂිං (ඩොලර් බිලියන 1.16) 8 වැනියා ය. අංක 9 ගුආඕ ගුඇංචෑං(ඩොලර් බිලියන 1.15)ය . ඔහුගේ ෆූසුන් සමූහය වානේ ,දේපල හා වෙලඳාමේ චීනයේ විශලතම සංගනයන්ගෙන් එකකි. ලැයිස්තුවේ අවසානයට එන ලූ ගුඇංකියු (ඩොලර් බිලියන1 .14) ගේ වෑංෂියෑං සමූහය 'ෆෝබ්ස්' සඟරාව විස්තර කරනුයේ ''රථවාහන කොටස් අධිරාජ්‍යය '' ලෙසය.

මෙම සුපිරි ඉසුරුමත් සහ කුඩා පෞද්ගලික ලොක්කන් ගනනාවක් සිය ධනය කඳු ගසා ගත්තේ කෙසේද යන්න චිනය තුල විවාදශීලී කාරනාවකි. 'ෆෝබ්ස් 'සඟරාව 2005 දී තරුන ව්‍යාපාරිකයෙක් සහ නැගී එන දේශපාලන තරුවක් වූ ෂෑං රොකුං චීනයේ පෝසතුන් අතර 16 වැනියා ලෙසට ලැයිස්තු ගත කලේය .කෙසේ වෙතත් පසුගිය වසරේ දී ෂැංහයි නුවර විශ්‍රාමික අරමුදලෙන් යුආන් බිලියන 3.1 නැතහොත් ඩොලර් මිලියන 400 ඉක්මවන මුදලක් සොරකම් කිරීම පිලිබඳව ෂෑං චෝදනා ලැබීය. ෂැංහයි හිටපු පක්ෂ ලොක්කා වූ චෙං ලියැංයුද සමග ඔහු වංචනික මුළුවක් (ීහබාසජ්එැ) පිහිටුවීම පිලිබඳව චෝදනා ලැබීය.

වර්තමාන චීකොස නායකත්වයට ගැඹුරුවන සමාජ අසමානතාවය සමග තවදුරටත් ඩෙංෂියොපිංගේ 1980 ගනන්වල සටන් පාඨය වූ 'කීප දෙනෙකුට පෝසත්වීමට ඉඩ දෙන්න' යන්න හුදෙක් පුනරුච්චාරනනය කල නොහැක. ඉසුරුමත් බවට පත්වූ සුළු පිරිස එය කර ගත්තේ ජනතාවගේ වැඩි දෙනාගේ වියදම මතින් බව හොඳින් පැහැදිලිය . එසේ තිබිය දී ජනාධිපති හූ සිය වැඩි වැඩියෙන් අපකීර්තියට පත්වන රජය ඔසවා තබා ගැනීමේ වෑයමක් ලෙස 'සමාජවාදී සුසංයෝගී සමාජයක් ' ගොඩනැගීමට කැඳවුම් කරයි.

චීන සමාජය 'සමාජවාදී' හෝ 'සුසංයෝගී' නැත. අතීතයේ දී චීකොප ය සාවද්‍ය ලෙෂ සමාජවාදය ආර්ථිකය මත නිලධාරිතාන්ත්‍රික රාජ්‍ය පාලනයට සමාන කලේය. කෙසේ වෙතත් 1990 ගනන්වල දී රාජ්‍ය අංශයේ බොහොමයක් පුද්ගලීකරනය කැරින . මෙම වසර තුල දී තවත් මිලියන 5 ක් කම්කරුවන් රාජ්‍ය ව්‍යවසායවලින් දොට්ට දැමෙන බව කම්කරු ඇමතිවරයා මේ මාසයේ දී පිලිගත්තේය. ප්‍රතිරූපීව, විදේශ ආයෝජන ද ඇතුළු පුද්ගලික අංශය ආර්ථිකයේ සියයට 65 ක වගකීම් දරන අතර බදු ආදායමින් සියයට 70 ක් සම්පාදනය කර දෙයි .

සමාජ ' සුසංවාදය ' පිලිබඳව නම් පෝසතුන් සහ දුප්පතුන් අතර පරතරය ගැඹුරු කරවමින් නව දේපල නීතිය මෙහි ප්‍රතිවිරුද්ධය ඉටු කරනු ඇත. දේපල වෙලදාම් හෝ කාර්මික ව්‍යාපෘතිය සඳහා ඉඩම් සම්පාදනය කිරීමට මාන බලන ප්‍රාදේශීය නිලධාරීන් විසින් බලහත්කාරයෙන් පිටමං කිරීමට එරෙහිව නව නීතිය ගොවීන් ආරක්ෂා කරනු ඇතැයි චීකොප නායකත්වය කියාපායි එහෙත් නීතිය පැහැදිලි කරන්නේ වසර 70 දක්වා භුක්තිය පමනක් වන අතර භූමිය පිලිබඳව රාජ්‍ය අයිතිය එය යලි තහවුරු කරයි.

1949 විප්ලවයෙන් අනතුරුව ඉඩම් ජනසතු කිරීම සමාජවාදී නොව ධනවාදී පියවරකි . ධනපති නිශ්පාදනයේ ස්ථාවරයෙන්, පුද්ගලික ඉඩම් අයිතිය පරපෝෂිතය- මක්නිසාද යත් පුද්ගලික බද්ද කම්කරු පංතියෙන් උරා ගන්නා අතිරික්ත වටිනාකමින් අඩු කිරීමක් වන අතර ප්‍රාග්ධනයේ නිදහස් චලනයට බාධාවකි. ඉඩම් පිලිබඳ රාජ්‍ය අයිතිය වඩා විශාල සංගත ලාභ සම්පාදනය කර දෙනවා පමනක් නොව ආයෝජකයන් සඳහා යටිතල පහසුකම් සැලසීමට සහ ආර්ථික කලාප පිහිටුවීමට ආන්ඩුවට වඩා පහසුවෙන් අවකාශ සලසා දෙයි.

රාජ්‍ය අයිතිය පිටිසර බදව වෙලඳපොල සබඳතා වර්ධනය උත්තේජ කිරීම මඟින් සුළු පරිමාන ගොවිපල විනාශ වී යාම වේගවත් කිරීම ද ඉටු කරන අතර එලෙස ග්‍රාමීය කම්කරුවන් නගරවලට සංක්‍රමනය වීම ද සිදු කරයි. ප්‍රතිඵලය වූයේ, බීජිං පොලිස් රාජ්‍ය විසින් අධීක්ෂනය කරනු ලබන ලෝක සංගත සඳහා වන ශ්‍රම ජනගහනයක් සහ වැඩෙන සමාජ ධ්‍රැවාන්තගත වීමක් ය.

නිල සංඛ්‍යා ලේඛනවලට අනුව චීනයේ ජිනි නිරූපකය ආදායම් අසමානතාවයේ මිම්ම සමාජ අසහනයට ගොදුරුවීම අඟවන 0.4 'අන්තරායකාරී මට්ටම' ට වඩා ඉහල අගයක් වන 0.5 කරා ලඟා වෙමින් තිබේ. නාගරික ආදායම් ග්‍රාමීය ප්‍රදේශ මෙන් 3.2 වාරයක් වන අතර එය 1978 දී පැවතියේ 2.5 වාරයක් ලෙසටය. නගරවල 2005 දී, (තිබෙන අලුත් ම දත්ත) ජනගහනයේ ඉහල සියයට 10 පහල දහයෙන් පංගුව මෙන් 9.2 වාරයක් උපයාගෙන තිබේ. 2004 දී මෙය 8.9 වාරයක් විය. ග්‍රාමීය ප්‍රදේශවල පරතරය වසරකට පෙර වූ 6.9 සංසන්දනාත්මකව 7.3 වාරයක් වීය. සමස්තයක් ලෙස දැන් පොහොසත්ම සියයට 10 පුද්ගලික දේපලවලින් සියයට 40 ක් පාලනය කරයි. එය දුගීම අයගේ සියයට 2 ට සංසන්දනාත්මක විය.

සමාජ අසංතෘප්තිය විසින් විරෝධතාවයන්ගේ උත්සන්න වූ රැල්ලක් ඇති කර තිබේ. එන්පීසී සමුළුවට හුදෙක් දින දෙකකට පෙර හුනාන් ප්‍රාන්තයේ ෂූෂැන් නගරයේ පුද්ගලික බස් හිමියන් ගාස්තු නැංවූ විට වැඩිපුරම සංක්‍රමනික කම්කරුවන්ගෙන් සමන්විත වූ 20,000 ක් ජනයා 1500 ඉක්ම වූ සන්නද්ධ පොලීසියත් සමඟ ගැටුනහ. පොලිස් වාහන කීපයක් ගිනිබත් වූ අතර දූසිම් ගනන් ජනයා තුවාල ලැබූහ. එක් සිසුවකු මිය ගිය වග වාර්තා විය.

ජනතා කෝපය මගහැරවීම පිනිස අගමැති වෙන් මේ වසරේ සමාජ වියදම් නාටකාකාරව ඉහල නංවීය. ග්‍රාමීය ප්‍රදේශවලට සියයට 15 ක්, මහජන සෞඛ්‍ය සේවයට සියයට 87 ක්, අධ්‍යාපන පද්ධතියට සියයට 42ක් සහ සමාජ ආරක්ෂනයට සියයට 14ක් ලෙෂ අරමුදල් ඉහල නැංවින. පිටිසර බදට වෙන් කරන ලද ඩොලර් බිලියන 51ම අනුග්‍රහක සෞඛ්‍යරක්ෂක රක්ෂන ක්‍රමයක් හා අවම ජීවනාධාරයක් ඇතුලත් වෙයි. 'සමාජ අරක්ෂන දැල ' සඳහා වන ඩොලර් බිලියන 27 ග්‍රාමීය සංක්‍රමනික කම්කරුවන් සහ වේගයෙන් වයසට යන ජනතාවට සීමිත ආරක්ෂාවක් සම්පාදනය සඳහා වෙයි. අධ්‍යාපනය සඳහා වන ඩොලර් බිලියන 11 ග්‍රාමීය ලමුන්ගේ පාසල් ගාස්තු ඉවත් කර දැමීම ඇතුලත් වෙයි.

මේ පියවරයන් සාගරයට වැටෙන ජල බිඳුවකි. 'සමාජ ආරක්ෂනතා දැල' බටහිර රටවලින් අර්ධව කොපි කර ගත් වෙලඳපල පදනම් කර ගත් විධික්‍රමයකි. කම්කරුවන්ය සිය රැකියාව අහිමි වුවහොත් හෝ බරපතල ලෙස රෝගී වුවහොත් සීමිත ආරක්ෂාවක් ලබා ගැනීම සඳහා කොටසක් ආන්ඩුවෙන් ගෙවනු ලබන රක්ෂනයන් මිලට ගැනීමට සිදුවේ.

සෞඛ්‍ය ආරක්ෂනයේ දී වානිජ රක්ෂන සමාගම් සමස්ත ජාතික වෛද්‍ය වියදමින් සියයට 70ක් වන යුආන් ට්‍රිලියන 6 ක් හෝ ඩොලර් බිලියන 780 ක දැවැන්ත වෙලඳාමක් වාර්ෂික පුද්ගලික වෛද්‍ය ගාස්තුවලින් ගසා කෑමට බලාපොරොත්තු වෙයි.

ඉතාමත් අසරන අයට මුදල් දීමේදී ලැබෙන සහයෝගය අවම වෙයි. දුප්පත්ම ගොවීන්ගේ දීමනාව ජාතික සංගත සීමාවට සුළු වශයෙන් ඉහල වන වාර්ෂික යුආන් 683 (ඩොලර් 88)කි . 2006 දී මෙම වැඩ සටහනින් ආවරනය වූයේ හුදු මිලියන 15 ක් වන අතර එය 2005 ට වඩා සියයට 82 ක වැඩි වීමකි . එවැනිම නාගරික ජාලයක් මිලියන 22.4 ක් ආවරනය කරන අතර එකි අයකුට මසකට හුදෙක් ඩොලර් 21 ක් ලැබෙයි.

ආර්ථික අස්ථාවර භාවය සමාජ ආතතිය තව තවත් අවුළුවා ලනවා පමනි. අගමැති වෙන් 2007 චීනයේ ආර්ථික වර්ධනය සියයට 8කට ප්‍රක්ෂිප්ත කලේය. කෙසේ නමුදු ගිය වසරේ දී ද ඔහු එම ඉලක්කයම තැබීය. ඔහුගේ ආන්ඩුවට පුද්ගලික ආයෝජකයන් සහ ප්‍රාදේශීය බලධාරීන් පොලඹ වන ආයෝජන බුබුළු වැලැක් වීමට ඉටු කල හැකි වූයේ සුළු ප්‍රමානයක් නිසා 2006 ඇත්ත රේට්ටුව සියයට 10.7 බවට පත් විය.'අලුත් මුදල්' කොටස් වෙලඳ පොලට ගලාවිත් එය ගිය වසරේ සියයට 130 දක්වා අහස උසට ගිය නමුත් පෙබරවාරියේ දී කැපී පෙනෙන අස්ථාවරතා පෙන් වීය.

එන්පීසී සමුළුවෙන් පසු පැවැති මාධ්‍ය සාකච්ඡාවක දී චීනයේ ආර්ථික තත්වය ''අස්ථාවර, අසමතුලිත, අසම්බන්ධීකාරක සහ තිරසාර නොවන '' බව වෙන් පිලිගත්තේ ය. එහෙත් අගමැතිවරයා ,ධනවාදීමය පිලිවෙත් ආපසු නොහරවන බව අවධාරනය කලේය. දැන් නිල වශයෙන් පවතින දෙබිඩි කථාව යොදා ගනිමින් ඔහු චීනය දැනට ''වෙලඳ පොල දිශාගත ප්‍රතිසංස්කරන ඉහල නැංවීම'' කාර්යභාරය කර ගත් සිය 'සමාජවාදයේ' පලමු පියවර වන ''සියක් වසරේ '' සිටින බව වාර්තාකරුවන්ට පැවසීය.

© www.wsws.org